අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.LK

11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව 1 කොටස කාලය පැය 1යි.

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ඉන්ධනමය ඛණිජ සම්පතකට ගැලපෙන ඛණිජය වන්නේ
   I. යෙල්ස්ඵා II. සිලිකා III. මයිකා IV. පෙට්‍රෝලියම්
2. පාෂාණ අතර අවසාදිත පාෂාණ ගණයට අයත් නොවන්නේ
   I. වැලිගල් II. ග්‍රැනයිට් III. හුණුගල් IV. ගල් අඟුරු
3. ශීත රටවල නිවාස උණුසුම් කිරීම සඳහා වැඩියෙන් භාවිතා කරන්නේ
   I. ගල් අඟුරු III. ස්වභාවික වායුව
   II. ඛණිජ තෙල් IV. සූර්ය බලය
4. වෘක්ෂලතා කෙරෙහි බල නොපාන සාධකයක් ලෙෂ සැලකෙන්නේ
   I. දේශගුණය II. පස III. දේශාංශ ගත පිහිටීම IV. භූමිය
5. ලෝකයේ නිවර්තන වර්ෂා ගණයට අයත් නොවන්නේ
   I. ඇමසන් II. කොංගෝ III. සයිබීරියන් IV. බෝර්නියෝ
6. ශ්‍රී ලංකාවේ මයෝසීන හුණුගල් වැඩිපුරම ව්‍යාප්තව ඇත්තේ
   I. බදුල්ල II. ත්‍රිකුණාමලය III. යාපනය IV. හලාවත
7. වාත්තු අච්චු නිපදවීම සඳහා වැඩිපුරම භාවිතා වන ලෝහ වර්ගය ලෙස සැලකෙන්නේ
   I. මිනිරන් II. තඹ III. ටින් IV. සින්ක්
8. ශ්‍රී ලංකාවේ වියළි මිශ්‍ර සදාහරිත වනාන්තරයකට අයත් නොවන්නේ
   I. සෝමාවතිය III. මාදුරු ඔය
   II. විල්පත්තුව IV. හෝර්ටන් තැන්න
9. ශ්‍රී ලංකාවේ අඩුම ජන ඝනත්වයක් ඇති දිස්ත්‍රික්කය වන්නේ
   I. වවුනියාව II. මුලතිව් III. හම්බන්තොට IV. පුත්තලම
10. 2006 ජන සංඛ්‍යාලේඛනයට අනුව වැඩිම ජනගහනය ඇති රට වන්නේ
    I. ඉන්දියාව II. චීනය III. ඉන්දුනීසියාව IV. ඇ. එ. ජ.
11. ලෝකයේ ලාභදායීම ප්‍රවාහන මාධ්‍ය වශයෙන් සැලකෙන්නේ
    I. නැව් මගින් ප්‍රවාහනය III. බවුසර් මගින්
    II. දුම්රිය මගින් IV. ගුවන් ප්‍රවාහනය
12. පැනමා ඇල පිහිටා ඇත්තේ
    I. මධ්‍යධරණී මුහුද - රතු මුහුද III. අත්ලාන්තික් සාගරය - අරාබි මුහුද
    II. අත්ලාන්තික් සාගරය - පැසිපික් සාගරය IV. පැසිපික් සාගරය - මධ්‍යධරණී මුහුද
13. ශ්‍රී ලංකාවේ දීර්ඝ කිරීමට අපේක්ෂිත දුම්රිය මාර්ගය ඉදිවන්නේ
    I. අවිස්සාවේල්ල - ඕපනායක අතර III. මාතර - තංගල්ල අතර
    II. මාතර - කතරගම අතර IV. ඕපනායක - හපුතලේ අතර
14. ස්වභාවික ආපදා අතර ජීව විද්‍යාත්මක ආපදා වශයෙන් හැඳින්විය හැක්කේ
    I. සුළි සුළං II. ලැව් ගිනි III. ගං වතුර IV. අකුණු කුණාටු



www.eduLanka.LK

15. සුනාමි ඇති නොවීමට බලපාන සාධකය වන්නේ

I. ටොනාඩෝ ඇතිවීම
II. භූ චලන ඇතිවීම
III. හිම කඳු කඩා වැටීම
IV. න්‍යෂ්ටික අත්හදා බැලීම්

- 16 - 25 ප්‍රශ්න වල හරි වැරදි ලකුණු කරන්න.

16. ලෝකයේ ප්‍රධාන තැටිතල හා කුඩා තැටිතල රාශියක් ඇති අතර ශ්‍රී ලංකාව අයත් වන්නේ ඉන්දු ඕස්ට්‍රේලියානු තැටි තලයටය. (     )
17. ලෝකයේ ගිනි කඳු රාශියක් ඇති අතර ජපානයේ ගිනි කන්දකි, විසුවියස් (     )
18. මෑත කාලයේ ඌරු උණ රෝගය දක්නට ඇති අතර එය මුලින්ම ඇති වූ ප්‍රදේශය ලෙෂ මෙක්සිකෝව ප්‍රසිද්ධව ඇත. (     )
19. ලොව පුරා ඇති ගංගා අතර ඕබි ගග යුරෝපයේ දක්නට ඇත. (     )
20. ආජන්ටිනාව සත්ව පාලනයට ප්‍රසිද්ධ අතර එහි ඇති තෘණ භූමිය ස්ටෙප්ස් නම් වේ. (     )
21. ශ්‍රී ලංකාවේ සල ගොවිතැන් ක්‍රමය අතීතයේ සිටම පැවති අතර එය ස්ථිර වගා ප්‍රදේශයක් බවට පත් වී තිබේ.(     )
22. ශ්‍රී ලංකාව තුල කාර්මික ජනපද රාශියක් ඇති අතර මහනුවර කාර්මික ජනපදයක් පිහිටා ඇත. (     )
23. ශ්‍රී ලංකාවේ ආදිවාසීන් රාශියක් ඇති අතර නැගෙනහිර පලාතේ තන්තිරිමලේ ආදි ජනාවාසයකට ප්‍රසිද්ධය.(     )
24. භූ විද්‍යාවේ චක්‍රීය සංකල්පය දක්නට ඇති අතර පාෂාණ නිර්මාණය වීමේ සරල ක්‍රියාවලිය චක්‍රියව සිදු නොවේ.(     )
25. ලොව පුරා ස්වාභාවික ආපදා රැසක් ඇති නමුත් සියළුම ස්වාභාවික ආපදා වලට මිනිසාගේ මැදිහත්වීම අදාල නොවේ. (     )

- 26 - 30 සුදුසු පරිදි යා කරන්න.

26. පලාලි - ධීවර වරායකි
27. රැකව - බොක්කකි
28. හම්බන්තොට - කලපුවකි
29. වැලිගම - ශුෂ්ක කලාපයට අයත්ය
30. බේරුවල - ගුවන් තොටුපොලකි

- 31 - 40 දක්වා ප්‍රශ්න වලට ප්‍රස්ථාරය ඇසුරින් පිළිතුරු සපයන්න




31. අංක (1) කොටසින් දැක්වෙන්නේ කුමක්ද?
32. දෙවන කොටසේ උපත් අනුපාතිකය ගැන කුමක් කිව හැකිද?
33. ඉහල උච්චාවචන අවධියේ ජනගහනය පහල මට්ටමේ පැතීමට හේතු ලියන්න.
34. පෙර ප්‍රසාරණ අවධියේ මරණ අනුපාතිකය පහල වැටීමටහේතුවක් ලියන්න.
35. පසු ප්‍රසාරණ අවධියේ ජනගහනය ඉහළ යාමට හේතු මොනවාද?

www.eduLanka.LK

36. පහල උච්චාවචන අවධියේ මරණ අනුපාතිකය ගැන කුමක් කිව හැකිද?
37. මෙම ප්‍රස්ථාරයට අනුව ශ්‍රී ලංකාව කිනම් අවධියක ගතකරනවා ඇද්ද?
38. දෙවන කොටසේ මරණ අනුපාතය ගැන කුමක් කිව හැකිද?
39. ඉහල උච්චාවචන අවධියේ ගත කරන්නේ කිනම් රටවල්ද?
40. මෙම ප්‍රස්ථාරයට අනුව සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින ගැටළුව කුමක්ද?

www.eduLanka.LK

අවසාන වාර පරීක්ෂණය - www.eduLanka.LK
11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව 11 ප්‍රශ්න පත්‍රය කාලය පැය 2යි.

1 කොටසේ ප්‍රශ්නය අනිවාර්යය වේ. 11 කොටසින් ප්‍රශ්න 2කටත් 111 කොටසින් ප්‍රශ්න 2කට පිළිතුරු සපයන්න.

1 කොටස

1. (අ) සපයා ඇති 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. පිළිතුරු දීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.
සිතියම් ප්‍රදේශය A,B හා C වශයෙන් කොටුකර කලාප තුනකට වෙන්කොට ඇත.

I. කොටුකර ඇති කලාප අතුරෙන් විච්ජින්න සානු ප්‍රදේශයක් බවට නිගමනය කළ හැකි භූ ලක්ෂණ ඇති කලාපය කුමක්ද?
II. D වලින් ආරම්භ වී E හිදී ප්‍රධාන ගගට වැටෙන අතු ගංගාව පහත් තැනි ප්‍රදේශයක් ඔස්සේ ඉතා සෙමින් ගලා බසින බවට දැක්විය හැකි සාධකයක් සඳහන් කරන්න.
III. මෙම ප්‍රදේශයේ උතුරු සීමාව ආසන්නයෙන් ප්‍රධාන පරිපාලන මායිමක් විහිදේ. එම පරිපාලන මායිම කුමක්ද?
IV. එම පරිපාලන මායිම තීරණය කිරීමෙහි ලා බලපා ඇති භෞතික සාධකය කුමක්ද?
V. X Y Z අක්ෂර වලින් දක්වා කඩ ඉරිවලින් කොටු කර ඇති ප්‍රදේශ අතුරෙන් එදිනෙද කටයුතු සඳහා වැඩි ජනතාවක් ඒකරාශී වෙතැයි සිතිය හැකි ප්‍රදේශය කුමක්ද?
VI. සිතියමේ නිරිත කෙළවරේ P සිට ඊසාන කෙළවරට ආසන්නයේ පිහිටි R දක්වා විහිදෙන දුම්රිය මාර්ගයෙහි දුම්රිය නැවතුම්පොළවල් කොපමණ සංඛ්‍යාවක් තිබේද?
VII. ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්තිය අනුව වතු ජනාවාස බහුලව ඇතැයි සිතිය හැක්කේ A, B හා C අතුරෙන් කවර කලාපයට අයත් ප්‍රදේශයේද?
VIII. ප්‍රවාහන පහසුකම් වඩාත් දියුණු මට්ටමක ඇති කලාපය කුමක්ද?
IX. සංවර්ධනය කිරීමේදී භෞතික දුෂ්කරතා ජයගැනීම සඳහා වැඩි වියදමක් හා වෙහෙසක් දැරිය යුතු කලාපය කුමක්ද?

(ආ) නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිත කොට පහත අංක 1 සිට 5 දක්වා දී ඇති දෑ සපයා ඇති ලෝක සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

1. මධ්‍යධරණී මුහුද හා අත්ලන්තික් සාගරය සම්බන්ධ කෙරෙන සමුද්‍ර සන්ධිය
2. පැසිපික් සාගරයේ සිට කැරිබියානු මුහුදට නැව් ගමන් කළ හැකි ඇළ මාර්ගය (මෙය උතුරු ඇමෙරිකා මහද්වීපය හා දකුණු ඇමෙරිකා මහද්වීපය අතර පිහිටා ඇත.)
3. පෘථිවි පරිභ්‍රමණයේ දී දෙසැම්බර් 22 දිනට හිරු මුදුන් වන අක්ෂාංශය
4. යුරෝපය හා ආසියා මහද්වීප වෙන් කෙරෙන ප්‍රධාන කඳු වැටිය
5. එක්සත් රාජධානියෙහි අගනුවර

(ඉ) නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිත කොට පහත අංක 1 සිට 5 දක්වා දී ඇති දෑ සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

1. ශ්‍රී ලංකාවේ අඩුම ජන ඝනත්වයක් ඇති දිස්ත්‍රික්කය
2. ශ්‍රී ලංකාවේ උතුරින්ම පිහිටි ප්‍රධාන වරාය

3. ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණායතනය පිහිටි නගරය
4. ශ්‍රී ලංකාවේ ගිනිකොන දිග ප්‍රදේශයේ පිහිටි වනසත්ව අභය භූමිය
5. ශ්‍රී ලංකාවේ දැනට ඉදිවෙමින් පවතින ගල්අඟුරු බලාගාරය පිහිටා ඇති අර්ධද්වීපය

11 කොටස

2.

I. විස්තෘත වාණිජ කෘෂිකර්මය යටතේ ලෝකයේ ප්‍රධාන වශයෙන් වගා කරන බෝගය කුමක්ද?

II. එම බෝගය ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ 3ක් සඳහන් කරන්න.

III. සියුම් පාරිභෝගික කෘෂිකර්මය සම්බන්ධයෙන් වර්තමානයේ යොදාගනු ලබන නව ප්‍රවණතා 3ක් පැහැදිලි කරන්න

3.

I. ඇස්කිමෝවරුන් හා පිග්මිවරුන් යන ආදි වාසීන් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ 2ක් දක්වන්න.

II. ඇස්කිමෝවරුන් භූ ගෝලීය පරිසරයට අනුවර්තනය වී ඇති ආකාරය නිදසුන් 2ක් දක්වමින් විස්තර කරන්න.

III. ලෝකයේ සීඝ්‍රයෙන් සිදුවන සමාජ ආර්ථික වෙනස්කම් ආදි වාසීන්ගේ පැවැත්මට අභියෝගයක් වී ඇති ආකාරය කරුණු 3ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

4.

I. පහත දී ඇති ඛණිජ වලින් ලබා ගන්නා ප්‍රයෝජනය දක්වන්න.
A කෙඔලින් B අවසාදිත හුණුගල් C සිලිකා

II. ඛණිජ සම්පත් ලබා ගැනීමේදී පරිසරය දූෂණය වන ආකාරය කරුණු 3ක් මගින් පැහැදිලි කරන්න.

III. ඛණිජ සම්පත් භාවිතයට ගැනීමේදී පරිසරයට වන හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 3ක් පැහැදිලි කරන්න.

111 කොටස

5.

I. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ප්‍රධාන අංග 2ක් නම් කරන්න.

II. වර්තමානයේ ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ යමින් පවතී. ඊට බලපා ඇති හේතු 3ක් දක්වන්න.

III. අනාගත ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ පදනමක් ලෙස ධීවර කර්මාන්තයට වැඩි වැදගත් කමක් හිමිවේ. කරුණු 3ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

6.

I. ශ්‍රී ලංකාවේ වනාන්තර කලාප 3ක් නම් කරන්න.

II. වනාන්තර විනාශය සඳහා බලපාන ස්වාභාවික සාදක 3ක් පැහැදිලි කරන්න.

7.

I. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළඳාමේදී කෘෂි නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට සාධාරණ ලෙස කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා භාණ්ඩ බෙදාහැරීමට පිහිටුවන ලද ආර්ථික මධ්‍යස්ථාන 2ක් නම් කරන්න.

II. විදේශ වෙළඳාමේදී ශ්‍රී ලංකාවට මුහුණපෑමට සිදුවන ගැටළු 3ක් දක්වන්න.

III. වෙළඳ කටයුතු වලදී කාර්යක්ෂම ප්‍රවාහන සේවයක වැදගත්කම කරුණු 2ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

www.eduLanka.LK